www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2006 ජුලි 4: ඇමරිකානු විප්ලවයෙන් වසර 230කට පසුව එක්සත් ජනපද ප්‍රජාතන්ත්‍රවාදයේ තත්වය

## July 4th 2006: The state of US democracy 230 years after the American Revolution

**බිල් වෑන් ඕකන් විසිනි**
**2006 ජුලි 04**

ලොව පුරා මහජනතාව උද්යෝගිමත් කරමින් විජිතවාදයට හා ඒකාධිපතිවාදයට විරුද්ධව විප්ලවයක් දියත් කල ලියවිල්ලක් වූ ස්වාධීනතා ප්‍රකාශනයේ 230 වන සංවත්සරය මෙම ජුලි 4 වන දාට යෙදෙයි. ප්‍රජාතන්ත්‍රවාදය, සමානතාව හා නීතියේ පාලනය පිලිබඳ බුද්ධිප්‍රබෝධයේ සංකල්ප මත පදනම් වූ නව ජාතියක් නිර්මානය කිරීම, ඉන් දහතුන් වසරක් ඇවෑමෙන් සිදු වූ ප්‍රන්ස විප්ලවය පිලිබඳ පෙරලකුනු පහල කල අතර, එවක් පටන් පරම්පරා ගනනාවක් තිස්සේ ජාත්‍යන්තර රාවප්‍රතිරාවයන් නංවා ලී ය.

1776 දී අත්සන් කෙරුනු ලියවිල්ල, ඇමරිකාවේ පමනක් නො ව සෑම දේශයක ම මහජනයාට සිය "අනන්‍යසන්තක අයිතීන්" පාගා දමන ආන්ඩු බලයෙන් පහ කරනු පිනිස විප්ලවවාදී විධික්‍රම යොදා ගැනීමට ඇති අයිතිය ප්‍රකාශයට පත් කරමින්, ප්‍රගාඪ ලෙස විමුක්තිදායක වූ ස්වභාවයක් දැරී ය.

බ්‍රිතාන්‍ය රාජාන්ඩුවට එරෙහි නැගිටීමට නායකත්වය දුන් අය තම ක්‍රියාවන්ගේ ජාත්‍යන්තර ඇඟවුම් ගැන ද ප්‍රකාශනයේ ලෝක ඓතිහාසික අර්ථභාරය ගැන ද මැනවින් දැනුවත්ව සිටියහ. ඛේදජනක හා ගැලපෙන ඓතිහාසික සම්පාතයකින් යුක්තව ස්වාධීනතා ප්‍රකාශනයේ 50 වන සංවත්සරය දා මිය ගිය ජෝන් ඇඩම්ස් වෙත ලියූ ලිපියක තෝමස් ජෙෆර්සන් සඳහන් කල පරිදි, "1776 ජුලි හතර වන දා ඇවිලුනු ගිනිදැල් ඒකාධිපතිවාදයේ දුබල එන්ජිම් මගින් නිවා දැමීමට නොහැකි තරම් පුලුල් ලෙස ලෝකයේ බොහෝ ප්‍රදේශ කරා පැතිර ගොස් තිබේ. එයට ප්‍රතිකූලව, ඒ ගිනිදැල් එම එන්ජිම් ද ඒවා ක්‍රියා කරවන්නන් ද දවා හලු කරනු ඇත."

ස්වාධීනතා ප්‍රකාශනය, බුද්ධිප්‍රබෝධයේ පරමාදර්ශයන්ගෙන් ද අවිද්‍යාව, සූරා කෑම හා අසමානතාව සම්බන්ධව එය සතු පිලිකුලින් ද පිරී තිබුනි. ඇත්ත වසයෙන් ම, මෙම ප්‍රජාතාන්ත්‍රික පරමාදර්ශයන් ඒවා වර්ධනය වූ සමාජ-ආර්ථික රාමුව යටතේ සාක්ෂාත් කර ගැනීමෙහි ලා පැවති නෛසර්ගික සීමාවන් ගැන මාක්ස්වාදීහු හොඳින් දනිති. දහඅට වන සියවසේ ඇමරිකාව තුල එම සමාජ-ආර්ථික රාමුව ගුනාංගීකරනය කෙරුනේ ධනපති දේපොල සබඳතා හා වහල් සේවය මගිනි. එහෙත් ප්‍රකාශනයේ ආරම්භක ඡේදවල ප්‍රජාතාන්ත්‍රික අන්තර්ගතය හා විශ්වීය අර්ථභාරය කිසි සේත් ම ප්‍රතික්ෂේප කල නොහැකි යඃ

"අපි මෙම සත්‍යයන් සම්බන්ධයෙන් ඒවා ම සාක්ෂ්‍ය දරන බව කියා සිටිමුඃ එනම්, සියලු ම මිනිසුන් මවනු ලබන්නේ සමානයන් ලෙස ය. ඔවුන්ට ඔවුන්ගේ මැවුම්කරුගෙන් නිශ්චිත අනන්‍යසන්තක අයිතීන් සමුදායක් උරුම වෙයි. එම අයිතීන් අතර ජීවිතය, නිදහස හා සතුට සොයා යාම පවතී. - පාලිතයන්ගේ අනුමැතිය වෙතින් සිය යුක්ති යුක්ත බලය උකහා ගන්නා ආන්ඩු මිනිසුන් අතර සංස්ථාපනය කර ඇත්තේ මෙම අයිතීන් සුරැකීම පිනිස ය, - මොන යම් හෝ රූපාකාරයක ආන්ඩුවක් වුව මෙම එල්ලයන්ට විනාශකාරී බවට පත් වන ඕනෑ ම විටක එය වෙනස් කොට හෝ අහෝසි කොට, තමන්ගේ ආරක්ෂාව හා සන්තුෂ්ටිය සාක්ෂාත් කර ගැනීමට බෙහෙවින් ම ඉඩ ඇතැයි ඔවුන්ට පෙනෙනු ඇති ආකාරයේ මූලධර්ම මත පදනම් දමමින් හා එවන් රූපාකාරයෙන් බලය සංවිධානය කරමින් නව ආන්ඩුවක් සංස්ථාපනය කර ගැනීම මහජනතාවගේ අයිතිය යි."

මීට සමාන භාෂාවක් අඩංගු ලියවිල්ලක් අද එක්සත් ජනපද කොන්ග්‍රසයේ එකදු සභාවක හෝ අනුමැතිය දිනා ගැනීමට සමත් වනු ඇතැයි ද නැත හොත් ධවල මන්දිරයේ වත්මන් පදිංචිකරුවාගේ නිෂේධ බලයෙන් එය ගැලවෙනු ඇතැයි ද යනුවෙන් කිසිවෙකුට බැරෑරුම්ව කියා පෑ හැකි ද? දැන් ඇමරිකානු ආන්ඩුව මෙහෙයවන අයගේ පිලිවෙත්වල හා ක්‍රියාවන්ගේ - විදේශීය හා දේශීය යන දෙඅංශයෙන් ම - සමස්ත අන්තර්ගතය ම සම වන්නේ 1776 පරමාදර්ශයන් හා මූලධර්ම මුලුමනින් ම ප්‍රතික්ෂේප කිරීමකට ය.

ස්වාධීනතා ප්‍රකාශනයේ විශාල කොටසක් සමන්විත වන්නේ, තුන් වන ජෝර්ජ් රජුට එරෙහි චෝදනා පත්‍රයකිනි. එය සුලු සංශෝධන සහිතව, එක්කෝ වත්මන් රිපබ්ලිකන් ආන්ඩුවට හෝ නැති නම් එහි ඩිමොක්‍රටික්

සහායකයන්ට එරෙහිව යුද අපරාධ සම්බන්ධ අධිචෝදනා පත්‍රයක් ලෙස, නැත හොත් සිය රට එක්සත් ජනපදය විසින් වාඩි ලා ගැනීමට එරෙහිව දූන් ප්‍රතිරෝධය දක්වන ඉරාක වැසියන්ගේ ක්‍රියාවන් දේශපාලනිකව යුක්ති යුක්ත කරන ලියවිල්ලක් ලෙස යොදා ගත හැකි ය.

අනෙකුත් චෝදනා අතර, "සිවිල් බලයෙන් ස්වාධීන වූ හා එයට වඩා උත්තරීතර වූ තත්වයක් මිලිටරියට ලබා දීම" සම්බන්ධයෙන් ද පැරනි බ්‍රිතාන්‍ය රජුට චෝදනා කරන ලදි. මෙය වනාහි, අසාධාරන ලෙස පෙර නොවූ විරූ බලතල අත්පත් කර ගැනීම යුක්ති යුක්ත කරනු පිනිස "ප්‍රධාන අන දෙන නිලධාරියා" ලෙස ජනාධිපතිට ඇති තත්වය දිගින් දිගට ම යොදා ගන්නා වොෂින්ටනයේ පාලනාධිකාරයක ආවේනික ලකුන බවට පත්ව ඇති අපයෝජනයකි.

"අප අතරට විශාල සන්නද්ධ බලකායන් යෙදවීම" සහ "බොරු නඩු විභාග මගින්, මෙම ජනපදවල පදිංචිකරුවන්ට එරෙහිව ඔවුන් සිදු කරන ඕනෑ ම ඝාතනයක් සම්බන්ධයෙන් දිය යුතු දඬුවම්වලින් ඔවුන් ආරක්ෂා කිරීම" ගැන ප්‍රකාශනය බ්‍රිතාන්‍ය රාජාන්ඩුවට චෝදනා කරයි.

එය තව දුරටත් මෙසේ සඳහන් කරයිඃ "ඔහු අපගේ මුහුදු කොල්ල කා, අපගේ වෙරල වනසා, අපගේ නගර ගිනිබත් කොට, අප ජනතාවගේ ජීවිත විනාශ කොට ඇත.

"අතිශයින් ම ම්ලේච්ඡ යුගයන් තුලත් සමාන අවස්ථාවන් සොයා ගැනීමට අසීරු මට්ටමේ කෲරත්වයේ හා ද්‍රෝහිත්වයේ කොන්දේසි සහිතව දූනට මත් ආරම්භ කෙරී ඇති, එමෙන් ම ශිෂ්ට සම්පන්න ජාතියක නායකයෙකුට කිසි සේත් ම නොවටනා ආකාරයේ ඝාතනයේ, විනාශයේ හා කෲර පාලනයේ කර්තව්‍යයන් සම්පූර්න කරනු වස් විදේශ කුලී හේවායන්ගෙන් යුක්ත විශාල හමුදාවන් ගොඩ බැස්සවීමේ වැඩ කටයුතුවල ඔහු මේ මොහොතේ යෙදී සිටී."

සෑම වචනයක් ම - "කොල්ල කෑම," "ඝාතනය," " විනාශය," "කෲර පාලනය," "කෲරත්වය," "ද්‍රෝහිත්වය" - අද ඊටත් වඩා විශාල බලයකින් යුක්තව, ඉරාකය තුල වොෂින්ටනයේ ම්ලේච්ඡ ආක්‍රමනයට හා වාඩි ලෑමට මනාව ගැලපෙයි.

එක්සත් ජනපදය නිර්මානයට තුඩු දූන් බ්‍රිතාන්‍ය විජිතවාදයට එරෙහි විප්ලවයෙන් වසර දෙසිය තිහකට පසුව, එක්සත් ජනපදයේ ආන්ඩුව ඉරාකයේ ජනතාව යටත් කර ගැනීමේත් එරට තෙල් සම්පත අල්ලා ගැනීමේත් එල්ලය ඇතිව විජිතවාදී යුද්ධයක් ගෙන යයි.

තමන් යුද්ධ කරන්නේ පවත්නා අධිරාජ්‍යයක් රැක ගැනීමට සහ දිගු කලක් තිස්සේ බ්‍රිතාන්‍ය යැයි සලකන ලද භූමි ප්‍රදේශ හා යටත් වැසියන් මත්තෙහි සිය පාලනය ආරක්ෂා කර ගැනීම පිනිස යැයි, සිය ආරක්ෂාව සඳහා ජෝර්ජ් රජුට අඩු ගනනේ තර්ක කල හැකිව තිබුනි.

අනෙක් අතට, ඉරාකය තුල එක්සත් ජනපදයේ විජිතවාදී ව්‍යාපෘතිය වනාහි නොපවතින ජන නාශක අවි හා ත්‍රස්තවාදී සබඳතා පිලිබඳ පචවල පදනම මත දියත් කරන ලද අප්‍රකෘපිත ආක්‍රමනයකි. නො වැලැක්විය හැකි ලෙස ම, එය එවන් මැදිහත් වීමක් හා බැඳී පවත්නා සියලු ම භයංකර ක්‍රියා හා අපරාධ නිර්මානය කරයි. එනම්, මෙම පචවල පදනම මත මිනී මැරීමට හා මිය යාමට යවන ලද සොල්දාදුවන් වඩා වඩාත් ම්ලේච්ඡත්වයට පත් වෙමින් නොනවතින යුද අපරාධ මාලාවකට තුඩු දී ඇත. මෙම සාපරාධී ව්‍යවසාය, දේශපාලන සංස්ථාපිතයේ කිසිදු කොටසකට නතර කල නොහැකි නැති නම් නතර නොකරන දේශපාලනික හා සදාචාරමය පවා වන ව්‍යසනයක් බවට පත්ව ඇත.

"බොහෝ අවස්ථාවන්හි දී ජූරියක් මගින් කෙරෙන නඩු විභාගයක වාසිය අපට අහිමි කිරීම" සහ " බොරුවට මවා පාන වැරදි සම්බන්ධයෙන් නඩු විභාගයන්ට ලක් කරනු පිනිස සාගරයෙන් එතෙරට අප ප්‍රවාහනය කිරීම" සම්බන්ධයෙන් ස්වාධීනතා ප්‍රකාශනය බ්‍රිතාන්‍ය රාජාන්ඩුවට තව දුරටත් චෝදනා කලේ ය.

ත්‍රස්ත සැකකරුවන් යැයි කියනු ලබන පුද්ගලයන් සාගරයෙන් එතෙර ප්‍රදේශවලට ප්‍රවාහනය කරමින් - මෙහි දී නඩු විභාග සඳහා නො ව වධබන්ධනයට ලක් කරනු පිනිස - "අතිවිශේෂ බලාත්කාරී ප්‍රවාහනය" පුරුද්දක් වසයෙන් ක්‍රියාවට දමන අතර, තමන් " සතුරු සටන්කරුවන්" ලෙස නම් කරන අය නඩු විමසීමකින් හෝ චෝදනාවලින් තොරව දින නියමයක් නැතිව රඳවා ගැනීමට තමන්ට අයිතියක් ඇතැයි කියා පාන එක්සත් ජනපද ආන්ඩුවක සන්දර්භය තුල, නැවතත්, ජෝර්ජ් රජුට එරෙහි චෝදනාවල භයංකර සමකාලීන ප්‍රතිරාවයක් පවතී.

සඳුදා *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රයේ පල වූ තියුනු තීරු ලිපියක, විප්ලවය සමයේ දී නිව් යෝර්ක් නගරයෙහි බ්‍රිතාන්‍යයන් විසින් සිරගත කරන ලද ඇමරිකානු විජිත වැසියන්ගේ ඉරනම ගැන, බෲක්ලින් විද්‍යාලයේ ඉතිහාසය පිලිබඳ මහාචාර්ය එඩ්වින් ජී. බරොව්ස් අවධානය යොමු කරයි. ප්‍රමානවත් ආහාර හෝ ජලය හෝ බින්දු මාත්‍රයක සනීපාරක්ෂක පහසුකම් නැතිව, පොදු හා පුද්ගලික ගොඩනැගිලි තුල මෙන් ම නිව් යෝර්ක් වරායේ නවතා තිබූ ආපදාවන්ට ලක් වූ නෞකාවල අටවන ලද තාවකාලික සිර ගෙවල් තුල ගාල් කරන ලද මෙම සිරකරුවන් මුහුන දූන් තුච්ඡ

කොන්දේසි හේතු කොට ගෙන ඔවුන්ගෙන් 12,000ක් හෝ ඊටත් අධික සංඛ්‍යාවක් මිය යන්ට ඇතැයි ඔහු තක්සේරු කරයි.

ඇමරිකානු කැරලිකරුවන්ට ම්ලේච්ඡ අයුරින් සැලකීම බ්‍රිතාන්‍ය රාජාන්ඩුව විසින් යුක්ති යුක්ත කරන ලද්දේ ඔවුන් "සොල්දාදුවන් නො ව 'කැරලිකරුවන්' වන අතර, ඔවුන් යුද සිරකරුවන් ලෙස අර්ථදැක්වීම ඇමරිකානු ස්වාධීනත්වය තත්වාකාරයෙන් පිලිගැනීමකට සම වේ" ය යන පදනම මත යැයි ඔහු සටහන් කරයි.

යුද සිරකරුවන්ට මානුෂික ලෙස සැලකිය යුතු යැයි නිර්දේශ කරමින් අලුතෙන් ස්වාධීන රාජ්‍යයක් වූ එක්සත් ජනපදය හා ප්‍රසියාව අතර 1785 දී අත්සන් කෙරුනු ප්‍රථම ගිවිසුම සඳහා ඇමරිකානු සිරකරුවන්ගේ ඛේදනීය ඉරනම මගින් කොන්දේසි නිර්මානය කෙරුනු බව ඔහු පෙන්වා දෙයි. ජිනීවා ගිවිසුමේ පෙරගමන්කරුවා වූයේ මෙම ලියවිල්ල යි.

එවන් ගිවිසුමක් ඊට පෙර ක්‍රියාත්මකව තිබුනේ වුවත් ඇමරිකානු සිරකරුවන් ගලවා ගැනීමට එය සමත් නොවීමට ඉඩ ඇතැයි යන්න සටහන් කරමින් මහාචාර්ය බරොවිස් සිය ලිපිය සමාප්ත කරයි. "අද එක්සත් ජනපදය මෙන් එදා බ්‍රිතාන්‍යය ලෝකයේ සුපිරි බලවතා විය. 'කැරලිකාර' සිරකරුවන්ට මානුෂික ලෙස සැලකීම ජෝර්ජ් රජුට අවශ්‍ය නොවුනා නම්, ඔහුට බාධක ලෙස පැවතියේ මූලධර්ම හා හෘදය සාක්ෂ්‍යය පමනි."

සිය ප්‍රකාශවල ඇඟවුම් ප්‍රකාශයට පත් කිරීමේ අවශ්‍යතාවක් ඉතිහාසඥයාට නොදැනුනු බවක් පෙනෙයි. ජිනීවා ගිවිසුම අභිභවා යාමත්, වොෂින්ටනයේ "ත්‍රස්ත විරෝධී ගෝලීය යුද්ධයේ" දී අත් අඩංගුවට ගත් අයට ජාත්‍යන්තර නීතිය යටතේ ලැබිය යුතු අවම අයිතීන් ප්‍රතික්ෂේප කිරීම සහ ඔවුන් වධබන්ධනයට ලක් කිරීම පවා යුක්ති යුක්ත කිරීම පිනිස ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් විසින් "සතුරු සටන්කරුවා" යන පදය යොදා ගැනීමත් අතර පවත්නා සමාන්තරයන් සියල්ල පැහැදිලි ය.

අනතුරුව ජාතියේ විප්ලවවාදී ආදිකර්තෘහු, කථනය, ආගම, පුවත්පත් හා රැස්වීම පිලිබඳ නිදහසත් නඩු විභාගවලින් තොරව රඳවා ගැනීමෙන් ආරක්ෂා වීමේ නිදහසත් හිතුවක්කාරී සෝදිසි කිරීම් හා අත් අඩංගුවට ගැනීම්වලින් ආරක්ෂා වීමේ නිදහසත් සහතික කරමින්, අයිතිවාසිකම් ප්‍රකාශනය තුල, "ජීවිතය, නිදහස හා සතුට සොයා යාම" පිලිබඳ "අනන්‍යසන්තක අයිතීන්" ප්‍රකාශයට පත් කලේ ය.

දැන් ආන්ඩුව පාලනය කරන මැර කල්ලි, ව්‍යවස්ථාවේ සිව් වන සංශෝධනය මුලුමනින් ම උල්ලංඝනය කරමින් සමස්ත ඇමරිකානු ජනතාවට ම පාහේ විරුද්ධව දැවන්ත හා නීති විරෝධී ඔත්තු බැලීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කරමින්, සියවස් ගනන් පැරනි මෙම ප්‍රජාතන්ත්‍ර අයිතීන් සියල්ල ම ආපසු හැරවීමේ ප්‍රයත්නයක යෙදී සිටිති.

මෙම අපරාධවලින් සමහරක් මාධ්‍ය මගින් සීමිත ආකාරයකින් එලිදරව් කිරීම කෙරෙහි පාලනාධිකාරය ප්‍රතිචාර දක්වා ඇත්තේ, නග්න බිය ගැන්වීමේ ව්‍යායාමයකිනි. එනම්, කොන්ග්‍රස් මන්ඩලය තුල සිටින පාලනාධිකාරයේ ප්‍රමුඛ රිපබ්ලිකන් ආධාරකරුවෝ එම පුවත්පත්වලට "රාජ්‍ය ද්‍රෝහී" චෝදනා එල්ල කරමින් ඒවාට විරුද්ධව අපරාධ සම්බාධක පනවන ලෙස ද ඉල්ලා සිටිති. ඔවුන්ගේ නරුම යුක්තිකරනය වී ඇත්තේ, "ත්‍රස්ත විරෝධී ගෝලීය යුද්ධය" යටතේ, පුවත්පත් නිදහස - 1776 සමග බැඳී ඇති සෙසු මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් බොහොමයක් මෙන් ම - ක්‍රියාත්මක කල නොහැකි දෙයක් බවට පත්ව ඇත යන්න යි.

දේශපාලන සංස්ථාපිතය තුල ඉතා සුලු විරුද්ධත්වයක් පමනක් සහිතව දැන් ගොඩ නැගෙමින් පවතින්නේ, ඇමරිකානු සමූහාන්ඩුවේ ආදිකර්තෘන් ව්‍යවස්ථාව තුලට ගෞරවයෙන් ඇතුලු කල සීමාවන්ගෙන් හා ආරක්ෂනයන්ගෙන් මුලුමනින් ම නිදහස් සහ එමෙන් ම ආන්ඩුව සිය "යුක්ති යුක්ත බලතල පාලිතයන්ගේ අනුමැතිය වෙතින්" උකහා ගත යුතු බවට ස්වාධීනතා ප්‍රකාශනයේ පැහැදිලිව ප්‍රකාශයට පත් කර ඇති අතිමූලික මූලධර්මයට ඍජු ලෙස විරුද්ධ ජනාධිපති ආඥාදායකත්වයකි.

සමලිංගික විවාහ තහනම් කිරීමක සිට ජාතික ධජය ගිනි තැබීම අපරාධයක් බවට පත් කිරීම දක්වා විහිදෙන ආකාරයේ ප්‍රතිගාමී හා ප්‍රජාතන්ත්‍ර විරෝධී අනපනත්වලින් එක්සත් ජනපද ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ විසකුරු මෙහෙයුමකින් කොන්ග්‍රස් මන්ඩලය ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි විධායක ශාඛාවේ ප්‍රහාරයට අනුපූරකයක් සපයා ඇත.

අතිශයින් ම පසුගාමී මනෝගතීන්ට ආයාචනය කිරීමේ ප්‍රයත්නයක් ලෙස, ඇමරිකානු විප්ලවයේ නිර්-ආගමික පදනම්වලටත් ප්‍රථම සංශෝධනයේ පැහැදිලිව ප්‍රකාශයට පත් කර ඇති පල්ලිය හා රාජ්‍යය එකිනෙකින් වෙන් කිරීම තුල දේහානුරූපව තිබෙන පරිදි එම විප්ලවය ආගම් පිලිබඳව පමනක් නො ව ආගම්වලින් ද නිදහස සම්බන්ධයෙන් කල තහවුරුවටත් එරෙහිව රිපබ්ලිකන් දක්ෂිනාංශය පූර්න පරිමාන යුද්ධයක් ගෙන යමින් සිටී. ආගමික ස්වෝත්තමවාදය නීතිගත කිරීමේ ද ගෝලීය උනුසුම් වීමේ පටන් මූල සෛල පිලිබඳ පර්යේෂන හා ලිංගිකව පැතිරෙන රෝගවලට ප්‍රතිකාර කිරීම දක්වා වූ සෑම දෙයකට ම සම්බන්ධිතව විද්‍යාවේ වර්ධනය ඇනහිටුවීමේ ද අනේකවිධ ප්‍රයත්න පවතී.

විප්ලවයේ ප්‍රජාතන්ත්‍ර පරමාදර්ශයන් ද ඇමරිකානු සමාජයේ සාමාජීය, දේශපාලනික හා ආර්ථික යථාර්ථයන් ද අතර පවත්නා ප්‍රතිවිරෝධතාව අන් කිසි දාක මෙතරම් තියුනු වී නැත.

පරමාදර්ශයන් හා යථාර්ථය අතර නොකඩව පුලුල් වන මෙම පරතරයට යටින් දිවෙන්නේ, මූල්‍ය සංගත ප්‍රභූන්ගේ පටු ස්තරයක් සහ ජනගහනයේ අතිමහත් බහුතරය වන ඇමරිකානු කම්කරු පන්තිය අතර පවත්නා පෙර නොවූ විරූ සමාජ ධ්‍රැවාන්තගත වීම යි. මුලින් කී පාර්ශ්වය ප්‍රධාන පක්ෂ දෙක ම ද ආන්ඩුවේ සංස්ථාපිතයන් සියල්ල ම ද පාලනය කරන අතර පසු පාර්ශ්වයට ප්‍රායෝගිකව ගත් කල දේශපාලනික අයිතීන් අහිමි කරනු ලැබ ඇත.

දරිද්‍රතාව, සෞඛ්‍ය සේවාව, අධ්‍යාපනය ආදිය ගැන අවධානය යොමු කරන වැඩ සටහන් හරහා සමාජ විහීනතාව හා අසමානතාව අඩු කිරීමේ එල්ලය සහිත සියලු පිලිවෙත් ප්‍රතික්ෂේප කරනු පිනිස, කෝටිපතියන්ගේ හා ලක්ෂපතියන්ගේ පාලක ප්‍රභුව ආන්ඩුව මත පවත්නා සිය ග්‍රහනය යොදා ගනියි. පුද්ගලික ධනයේ නිර්බාධිත සමුච්චය වීමට බලපාන ඉවසිය නොහැකි බාධාවන් ලෙස එවන් සියලු පිලිවෙත් ඉවත දමයි. ඒ වෙනුවට, සාමාජීයව නිර්මිත ව්‍යසනයන්ට මුහුන දෙන අයට බිල් ගේට්ස් හා වැරන් බෆට් වැනි කෝටිපතියන්ගේ දානපති ත්‍යාග මත විශ්වාසය තබන ලෙස කියනු ලැබේ.

ඇමරිකාවේ බිහි වීමට පාදක වූ ලියකියවිලිවල අඩංගු ප්‍රජාතන්ත්‍ර මූලධර්ම සමාජ හා ආර්ථික අසමානතාවේ නිර්බාධිත ගැඹුරු වීම සමග සමහන් කිරීම කල නොහැකි ය. මෙම ධ්‍රැවාන්තගත වීම මගින් නිර්මානය කෙරෙන යටින් දිවෙන සමාජ ආතතීන්, සුපිරි ධනවතුන් සඳහා සුපිරි ධනවතුන් විසින් මුලුමනින් ම දුවවනු ලබන ආන්ඩුවක් වෙතින් වඩ වඩා විරසක වෙමින් හා එයට සතුරු වෙමින් සිටින වැඩ කරන ජනතාවන් අලලා ලත් සමාජ හා දේශපාලනික අරගල තුල, සිය ප්‍රකාශනය නො වැලැක්විය හැකි ලෙස ම සොයා ගත යුතු ය.

තමන්ගේ "අනන්‍යසන්තක අයිතීන්" විනාශ කරන ඕනෑ ම ආන්ඩුවක් "වෙනස් කිරීමට හෝ අහෝසි කිරීමටත්" "තමන්ගේ ආරක්ෂාව හා සන්තුෂ්ටිය සාක්ෂාත් කර ගැනීමට බෙහෙවින් ම ඉඩ ඇතැයි ඔවුන්ට පෙනෙනු ඇති" නව ක්‍රමයකින් එය විස්ථාපනය කිරීමටත් මහජනතාවට පවත්නා අයිතිය ස්වාධීනතා ප්‍රකාශනය මගින් තහවුරු කර තිබීම, 2006 ජුලි 4 වන දා යලි මතකයට නැංවීම සුදුසු වේ.

යුද්ධය, දරිද්‍රතාව හා පීඩනය අවසන් කරන නව විප්ලවයක් තුල ලොව පුරා කම්කරුවන් සමග ඒකාබද්ධ වී, පාලක ප්‍රභුවක ලාභ ගැරීමේ අවශ්‍යතා වෙනුවට බහුතරයේ අවශ්‍යතා සපුරා ලනු පිනිස සංවිධානය වූ සමාජවාදී සමාජයක් ගොඩ නගමින්, ඇමරිකානු වැඩ කරන ජනතාව මෙම විශ්වීය අයිතිය භාවිතයෙහි යොදවන දිනය පිලිබඳව සමාජවාදී සමානතා පක්ෂය විශ්වාසයෙන් යුක්තව පෙරමග බලා සිටී.

© www.wsws.org